17/07/2011 - ඉරිදා ලංකාදීප

**ගැටලු අවම කරන තීන්දු ගැනීම - මිලින්ද මොරගොඩ**

පසුගිය සති කිහිපය තුළ මහජනතාව ජීවත් වූයේ දෙලොවක් අතරය. තමන් ගේ ප්‍රධාන ආහාරය වූ සහල් ආසනික් මිශ්‍ර බවට ප්‍රචාරය විය. රට පිළිගත් විද්වත්හු දෙපිළ බෙදී ස්වකීය අදහස් පතුරවන්නට පටන් ගත්හ. එයින් ඉනික්බිතිව ආන්දෝලනයට ලක්වූයේ බාල පෙට්‍රල් ආනයනය කර බෙදා හැර ඇති අතර මේ නිසා වාහන අක්‍රීය වී බරපතල හානියක් සිදුවන බවය. මෙම තොරතුරු වේගයෙන් පැතිරයාම හමුවේ ඒ වන විට විශාල අවධානයක් දිනාගෙන තිබුණ චැනල් ෆෝ රූපවාහිනියේ සිද්ධිය යටපත් විය. ජීවන වියදම ගැන නැගී තිබුණ මහජන මතය අනවධානයට ලක්විය. විශ්ව විද්‍යාල වල අධ්‍යාපනය, විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රශ්නය යටපත්විය.

ශ්‍රී ලංකාව ගැටුම් බහුල කාල පරිච්ඡේදයක් අවසානයේ සන්සුන් සහගත යුගයකට ප්‍රවේශවෙමින් සිටී. එය වසර තිහකට පසු අලුත් තත්ත්වයකි. යුද්ධයක දී පළමුවෙන් ඝාතනයවන්නේ සත්‍යයැයි කියමනක් ඇත. පසුගිය ගැටුම් පැවති සමයේ උතුර දකුණ අතර තොරතුරු හුවමාරු වූයේ නොයෙකුත් සන්නිවේදන බාධා සහිතවය. දෙපාර්ශවය ම හුවා දක්වන ලද්දේ තමන්ට වාසි සහගත තොරතුරු පමණකි. තීරණාත්මක අවස්ථාවල දී මාධ්‍ය වලට ලැබෙන තොරතුරු පාලනය කළ බව ඉතිහාසය අධ්‍යයනය කරන විට පෙනේ. මෙවැනි පසුබිමක් තුළ කට කතා වලට අවස්ථාව ලැබේ. නොයෙකුත් කටකතා පැතිරෙන අතර එවැනි දේ පැතිරෙන විට සමාජය නොසන්සුන් වෙයි. අතීත යේ එවන් අත්දැකීම් සහිත අප දැන් අවතීර්ණ වී සිටින්නේ සාමකාමී යුගයකටය. යුද කාලපරිච්ඡේදයකට වඩා සාමකාමී වකවානුවක මුහුණ දෙන්නට සිදුවන අභියෝග වෙනස්ය. එල්ල වන අභියෝග ඉදිරියේ ක්‍රියාකළ යුතු උපායශීලී අන්දමටය. විනිවිද පෙනෙන ආකාරයටය.

කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා වශයෙන් විවිධ යුග ලෝකය දියුණුවන කාලයේ දී පැවතින. මෙම කාලවලදී වැඩි බලයක් හිමිවූයේ ශ්‍රමයටය. කාය බලය ඇති කම්කරුවාට ලැබුණේ ඉහල අවස්ථාවකි. කම්කරුවාගේ අයිතිය හා කාර්යක්ෂමභාවය වෙනුවෙන් නීති රීති හා සුබසාධන වැඩ පිලිවෙල එකී කාලයේ දී සම්පාදනය විය. දැන් උදා වී ඇත්තේ දැනුම පදනම් කර ගත් සමාජයයි. මෙම යුගයේ මානව සම්පත ඉතාමත් වැදගත් සාධකයකි. බුද්ධියට ගරු කරන අන්දමට තීරණ ගැනීම අලුත් පිළිවෙත වී තිබේ. එයට අනුව ලාංකික සමාජය යොමු කිරීම කෙරෙහි අප අවධානය යොමු කළ යුතුය. විනිවිද පෙනන ස්වභාවය එහි ඇති වැදගත්කමයි. ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණු තත්ත්වයක් වශයෙන් ද එය සැලකිය හැකිය. නිවැරදි තොරතුරු දැනගත්විට හරය කෙබඳු ද යන්න පැහැදිලි කරගෙන තීන්දුවකට පැමිණෙන්නට මහජනතාවට හැකිවෙයි.

අප රටේ ජනතාව අධ්‍යාපනය හා බුද්ධිය අතින් පොහොසත්ය. පරිගනක තාක්ෂණය හා අන්තර්ජාලය පරිහරණය සම්බන්ධයෙන් ප්‍රගතියක් දක්වයි. විදුලි සංදේශ සේවාවේ විප්ලවීය වෙනසක් ඇති වී තිබේ. මෙයට අවුරුදු කිහිපයකට කලින් දුරකථනයක් පාවිච්චි කළ හැකි වූයේ වරප්‍රසාද ලත් පෙළැන්තියට පමණකි. ජංගම දුරකථනය සමාජයේ ධනවත්කම පෙන්වන සංකේතයක් විය. තොරතුරු හුවමාරුවේ දී වැදගත් වන දුරකථනය හා ජංගම දුරකථනය අද සාමාන්‍ය මෙවලමකි. ජංගම දුරකථනයක් නැති නෙනෙකු සොයා ගැනීමට අපහසු තරමට එය වේගයෙන් ව්‍යාප්ත වී තිබේ. සාමාන්‍යයෙන් කෙනෙකු පවා කෙටි පණිවුඩ යවන අතර තරුණන් ජංගම දුරකථනය මගින් විද්‍යුත් තැපැල් පණිවුඩ යවති. ට්විටර්, ෆේස් බුක් වැනි සමාජ ජාල හා එක්වෙති. අන්තර් ජාලය පරිහරනය කරති. මෙය විශාල වෙනසකි. මෙම වෙනස් සිදුවූයේ අප බලා සිටිය දී අවුරුදු කීපයක් ඇතුලතය. දුරකථන මෙවලම්, සම්බන්ධතා හා භාවිතා කිරීමේ ගාස්තු අඩුවීම සමාජය තුළ එය පැතිරෙන්නට බලපෑ හේතුවකි. හදිසි පණිවුඩයක් දැනුම් දෙන්නට විදුලි පුවත් යැවූ යුගය අවසන් වී ඇති අතර තැපැල් දෙපාර්තමේන්තුව මෑතක දී විදුලිය පුවත් සේවාව අහෝසි කිරීම ගැන අවධානය යොමු කරන ලද බව වාර්තා විය. එය සන්නිවේදනයේ අප අත් විඳින පෙරැළියයි. තවත් දශකයකට දෙකකට පසු මෙරට තොරතුරු හුවමාරුව කෙබඳු දියුණුවකට පත්විය හැකිද? වර්තමානයේ ඇතිවන වෙනස්කම් අනුව එය සිතා ගැනීමට පවා අපහසු එකක්වනු නිසැකය. ඒ අතරම ප්‍රජාතන්ත්‍රවාදය තව තවත් පුළුල්ව වැඩෙමින් තිබේ. මහජනතාව ද එහි පොහොසත් ලක්ෂණ අපේක්ෂා කරයි. දියුණුවෙමින් පවතින එහි විශිෂ්ඨ අංග මෙරට සමාජයට හඳුන්වා දිය යුතුය. එය අප සියලු දෙනාගේ ම වගකීමකි.

දුරකථනය භාවිතා කරන ආකාරය අනුව අපට පෙනෙන්නේ මහජනතාවට අවශ්‍යවන්නේ පහසුවෙන් තම තොරතුරු හුවමාරු කර ගැනීමේ  අවශ්‍යතාව එයින් සපුරා ගන්නා බවය. අලුත් දැනගැනීමට ඕනැම කෙනෙකු තුළ ඇත්තේ නොසන්සිඳෙන උවමනාවකි.  එය උදෙසා සමාජය නොයෙකුත් උපාය අනුගමනය කරති. සම්ප්‍රදායික ආකාරයෙන් තොරතුරු නොලැබෙන අවස්ථාවේ දී විකල්ප මාර්ග ඔස්සේ ස්වකීය තොරතුරු අවශ්‍යතාව සපුරා ගන්නට උත්සාහ කරති. අතීතයේ දී කටකතාවෙන් පැතිර ගිය ආරංචි අද පැතිරෙන්නේ ජංගම දුරකථනයේ කෙටි පණිවිඩයකින්ය. විද්යුත් තැපෑල මගින්ය. එය සන්නිවේදනයේ අලුත් මුහුණුවරයි. වෙබ් අඩවියක, බ්ලොග් සටහනක සඳහන් වන දේ ඉතාමත් ඉක්මනින් රට පුරා පැතිරෙන අතර එහි සත්‍ය අසත්‍ය භාවය විභාග කෙරෙන්නේ පසුවය. සංස්කාරක හෝ කර්තෘවරයෙකු ගේ වගකීමට යටත්ව නැතිව තොරතුරු මුදාහැරෙන නිසා මෙසේ පැතිරෙන තොරතුරු හානිකර වන්නට ද ඉඩ තිබේ.

අන්තර්ජාලය ගෝලීයකරණ සංකල්පය ප්‍රායෝගික එකක් කළේය. ලෝකයේ එක් කෙළවරක සිදුවන දේ ඉතාමත් ඉක්මනින් දැනගන්නට තොරතුරු තාක්ෂණය අනුව ඉඩ සැලසී ඇත. ඊ මේල්, වෙබ් අඩවි, බ්ලොග්, ෆේස් බුක් හා ට්විටර් වැනි සමාජ ක්‍රියාකාරකම් භූගෝලීය සීමා මායිම් නොතකමින් ඒ වෙනුවෙන් පහසුකම් සලසයි. මෙම තත්ත්වය අපේ භාවිතාවට ගැනෙන්නේ කෙබඳු ආකාරයට දැයි විමසිලිමත්වීම සමාජයේ වගකීමකි. සහල්වල ආසනික් ඇති බව ප්‍රකාශ කරමින් මහත් ආන්දෝලනයක් පැතිරීම හා තත්ත්වයෙන් බාල පෙට්‍රල් සම්බන්ධ තොරතුර ප්‍රචාරයවීම ප්‍රවෘත්ති මූලාශ්‍ර රහිතව දිවයින පුරා තොරතුරු ඉක්මනින් ගලායාම සම්බන්ධ මෑතකාලීන උදාහරණයකි. අතීතයේ මෙන් පාලනය කළ නොහැකි, නොයෙක් අන්දමින් තත්ත්වය විග්‍රහ කරන ආරංචි පැතිරයන තොරතුරු තාක්ෂණ යුගයේ දී ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට ද වඩාත් ප්‍රායෝගික මුහුණුවරක් ගන්නට සිදුව තිබේ.

අන්තර් ජාලය නිසා යම් කරුණක් ගැන එකම අදහස දරණ කණ්ඩායමක් ලෝකයේ විවිධ රටවලින් එකතු වී විශාල බලවේගයක් බවට වීම හා  බලපෑම් කරන කණ්ඩායමක් බවට පත්වෙයි. ඒ හමුවේ ඕනෑම රටකට තොරතුරු වාරණය පහසු නැත. සෘජු මේ නිසා සිදුවන සමාජ ආර්ථික පරිවර්තනය සුවිශේෂීය. එයට විකල්පයක් වශයෙන් මහජනතාවට ස්වකීය පාලනයේ තොරතුරු දැනගැනීමට ඇති අයිතිය නීතියෙන් තහවුරු කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී රටවල් පියවරගෙන තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදයත් එහි වගන්ති තිබූ පමණින් ජනතාවගේ අයිතිවාසිකම් හිමිවන්නේ නැත. ඒ වෙනුවෙන් නව නීති රීති සම්පාදනය විය යුතුය. අලුත් ආකල්ප ඇතිව ක්‍රියා කළ යුතුය. ජනමාධ්‍ය, බුද්ධිමතුන්, ජනමත ප්‍රධානීන් හා සිවිල් සමාජය එය වෙනුවෙන් පෙනී සිට මෙවැනි නව ප්‍රවනතා ගැන සාකච්ඡා කළ යුතුය. 2003 වසරේ දී එක්සත් ජාතික පෙරමුණු රජය මාධ්‍ය කෙරෙහි බලපැවැත්වූ සාපරාධී අපහාස නීතිය ඉවත් කළේය. තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුලු අලුත් අදහස් ඇති පණත් ගණනාවක් යෝජනා කළේය. නමුත් එය පණතක් වශයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට ඉඩ ලැබුණේ නැත. තොරතුරු දැනගැනීමේ අයිතිය පාර්ලිමේන්තු පණතකින් සම්මත වී එය නීතියකින් තහවුරුකළ හැකි නම් එය ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් විශාල අවස්ථාවකි. මහජනතාව හා මහජන නියෝජිතයන් අතර ක්‍රියා පටිපාටියේ විනිවිද භාවයක් තිබිය යුතුය. බලය ආරක්ෂා කරගැනීම ඉදිරියේ රජය හා සමාජය අතර පරතරයක් නිරායාසයෙන්ම ඇතිවෙයි. මහජනතාවට රජයේ තොරතුරු ගලායාම අවහිර වෙයි. රජය තොරතුරු සැපයීමෙන් ඈත්වන විට මුලින් සඳහන්කළ පරිදි මහජනතාව තොරතුරු උපකල්පනය කරන්නට පටන් ගනී. ඕපාදූප හා පදනම් විරහිත කරුණු තොරතුරු ලෙස පොදු ජනතාව අතට පත් වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ආණ්ඩු පක්ෂය හා විපක්ෂය ද සිටී. ආණ්ඩුව යම් තීරණයක් ගන්නා විට එහි තොරතුරු හෙළිකරන ලෙස විරුද්ධ මත දරන පක්ෂ බලකරයි. දූෂණ වංචා බව කියමින් චෝදනා කරයි. මේ නිසා ඇතිවන්නේ විශාල ඝෝෂාවකි. ඇත්ත කුමක්ද? සිදුවන්නේ කවරක්ද යන්න වටහාගත නොහැකිවෙයි. විනිවිද භාවයකින් යුතුව තොරතුරු සම්පාදනය මෙම අවදානමෙන් මිදෙන්නට විශාල කාර්යය භාරයක් ඉටු කරනු ඇත. එය කළ හැක්කේ මහජනතාවට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය තහවුරු කිරීමෙනි.

තමන් ගෙවන බදු මුදල් වැය කරන්නේ කෙසේ ද යන්න දැන ගැනීමට අයිතියක් ජනතාවට ඇත. එය පිළිගත යුතුය. මහජන මුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක වියදම් හා කොන්ත්‍රාත්කරුවන්ගේ පසුබිම දැනගැනීමට ඉඩ ලැබීම දූෂණ වංචා අවම කිරීමට හේතුවකි. තමන්ගේ දරුවා පාසලට ඇතුලත් කර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත්නම් පාසලට ඇතුලත්කර ගෙන ඇති දරුවන් කවුරුන් ද ඔවුන්ට නිසි සුදුසුකම් තිබේ ද යන්න දැන ගැනීමට දෙමාපියන්ට අයිතියක් ඇත.

ටෙන්ඩර් කැඳවීම් හා ටෙන්ඩර් තීන්දුගැනීම් සම්බන්ධයෙන් රජයට අනේක විට චෝදනා එල්ලවෙයි. ටෙන්ඩරය දිනා ගන්නට අසමත්වන පුද්ගලයා සිතන්නේ එය තමන්ට නොලැබීම හරහා විශාල මුදල් වංචාවක් වී ඇති බවයි. ඉන්දියාව මේ වන විට ටෙන්ඩර් කැඳවීම පමණක් නොව ටෙන්ඩර් තීන්දු පවා අන්තර්ජාලයේ ප්‍රසිද්ධ කරයි. එම තොරතුරුවලට අනුව ටෙන්ඩර් පටිපාටිය සිදුවූයේ කෙසේද යන්න පැහැදිලිවෙයි. සේවාව අවශ්‍ය පුද්ගලයා හා සපයන්නා අතර ට අතරමැදියන් වැඩිවන තරමට දූෂණ වැඩිවන බව ප්‍රකට කාරණයකි. තොරතුරු විනිවිදව පෙනෙන අන්දමට සකස් කළහොත් අතරමැදියන්ට ඉඩ කඩ අහිමි වෙයි. මෙරට නිලධාරීන් දූෂණ වංචා චෝදනා නිසා රාජ්‍ය සේවාව අකර්මන්‍යවී තිබේ. නිලධාරීන් තමන්ට චෝදනා එල්ල වෙතැයි බියෙන් තීන්දු ගැනීමෙන් වැලකී සිටී. එයට විකල්පයක් විය හැක්කේ රජය ගන්නා තීන්දු විවෘතව සමාජයට ඉදිරිපත් කිරීමෙන් පමණකි. මෙය අලුත් අත්ද්‍රැකීමක් බැවින් එයට අවශ්‍ය නෛතික පසුබිම සකස් කළ හැක්කේ තොරතුරු ග්‍රහනගැනීමේ අයිතිය නීතිගත කිරීමෙන් පමණකි.

දූෂණය ආණ්ඩු බලයට පත්කරන ජනප්‍රිය සටන් පාඨයකි. නමුත් අලුත් ආණ්ඩුව එන විට පැරණි වැරදි අමතක කරයි. බලයෙන් පහවී විපක්ෂයට යන පාලක පිරිස දැන් විපක්ෂයේ සිට ආණ්ඩුවේ වැරදි සොයන්නට පටන්ගනී. සත්‍ය, අසත්‍ය හා දූෂමාණ ආරංචි පතුරවා ආණ්ඩුව අසාර්ථක බව පෙන්වීම හැම විපක්ෂයකම උත්සාහයයි. නිදහස ලැබූ දා පටන් ම රටට ඇත්තේ එවැනි අවාසනාවන්ත තත්ත්වයකි. දූෂණ, වංචා හෝ අක්‍රමිකතා ගැන නිවැරදිව මහජනතාවට කරුණු දැන ගැනීමට අයිතියක් ඇත්නම් මේ අන්දමට ප්‍රජාතන්ත්‍රවාදය අයුතුලෙස ප්‍රයෝජනයට ගන්නට කිසිවෙකුට ඉඩ නොලැබේ.

ඉන්දියාව තොරතුරු දැන ගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කර තිබේ. යුරෝපීය හා බටහිර රටවල් මහජනතාවට රජයේ ක්‍රියාපටිපාටිය හා තිරණ ගන්නා අන්දම දැනගැනීමට විවෘතව අවස්ථාව දී තිබේ. මේ නිසා ඇත්ත කුමක්දැයි තෝරා ගැනීමට අවකාශ හිමිවෙයි. ශ්‍රී ලංකාව එම අලුත් තත්ත්වය අධ්‍යනයය කර එහි වැදගත්කම අවබෝධ කරගත යුතුය. මෙම වැදගත් ආකෘතිය ක්‍රියාවට නංවන්නට අවශ්‍යව ඇත්තේ රජයේ හා විපක්ෂ දේශපාලන පක්ෂවල උනන්දුවය.

මෙවැනි නීති ඇතිකිරීමෙන් ආණ්ඩුවේ සියලු දේ නිරාවරණය වන අතර රාජ්‍ය පාලනයට බාධා ඇතිවේ යැයි උපකල්පනයකිරීම සාධාරණ නැත. මහජනතාවට විවෘතව තොරතුරු දැනගත හැකි පැති හා ජාතික ආරක්ෂාවට සහ රටේ උන්නතියට බාදා කරන තොරතුරු මෙම විවෘත භාවයට ලක් නොකර පවත්වාගෙන යා හැකිය. එය කළ හැකි වන්නේ එකඟතාවයෙනි. යම් කාරණයක් ගැන නිශ්චිත කාලසීමාවක් දක්වා සාධාරණ හේතු මත තොරතුරු නිකුත් කළ නොහැකි බව ආණ්ඩුවට කියන්නට අයිතියක් ඇත. ඒ සමගම එදිනෙදා ජීවිතයට වැදගත් කරුණු කෙලින්ම ආණ්ඩවෙන් විමසන්නට මහජනතාවට ද අයිතියක් තිබිය යුතුය. අද එය දියුණු සමාජයක ලක්ෂණයකි. අප ප්‍රවේශ විය යුතු එකී දියුණු ප්‍රතිපත්ති කරා බව සඳහන්කළ යුතුය.